චක්‍ර අංක 2003/12


ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகறீஸ் ஈவெந்யூ, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / பெக்ஸ் / Fax : 684051

ඊමේල් / ஈ-மெயில் / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO : 4/10/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE : 2003.09.26

පළාත් ඉඩම් කොමසාරිස්
අකුණු පළාත් සභාව
13 OCT 2003
ගාල්ල.

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## දීර්ඝකාලීන බදුකර ලබාදීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම

දීර්ඝකාලීන බදුකර නිකුත් කිරීම සඳහා මූලික නිර්දේශ එවන අවස්ථාවලදී බොහෝ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩමේ තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමටත්, ඉඩමේ පිඹුරක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව ලවා අසස් කිරීමටත් කටයුතු කරන බව පෙනී ගොස් ඇත. මෙය අනවශ්‍ය කාලය මිඩංගු කිරීමක් වන බැවින් මූලික වාර්තා එවීමේ දී ඉඩමේ අනුරේඛණයක් එවීමත්, ඔබ විසින් තීරණය කරනු ලබන බදු තක්සේරුවක් සඳහන් කිරීමත් ප්‍රමාණවත් වන බව කරුණාවෙන් දන්වමි.

දීර්ඝකාලීන බදුකර යටතේ නිවාස කටයුතු සඳහා දී ඇති ඉඩම් සංවර්ධනය කිරීමෙන් පසු, දීමනාපත්‍ර ලබාදීමට නිර්දේශ එවන ආකෘතිවල අඩුපාඩුකම් නිසා බොහෝවිට තීරණ ගැනීමට අපහසු තත්වයක් ඇති වී තිබේ. එබැවින් මින් ඉදිරියට දීමනාපත්‍ර සඳහා නිර්දේශ එවීමේ දී මේ සමඟ අමුණා ඇති ආකෘතිය භාවිතා කිරීමට කරුණාකර කටයුතු කරන්න.

දීර්ඝකාලීන බදුකරයක් සඳහා ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබුනු පසු ඉඩමහාර දීමට ඔබ වෙත විධිමත් පරිදි මවිසින් දැනුම්දුන් පසු ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තක්සේරුකරු වෙත ඔබ විසින් දැනුම්දිය යුතුය. එසේ දන්වා යවන ලිපියේ ඉඩම් කොමසාරිස්ගේ ලිපිගොනු අංකය අනිවාර්යයෙන් සඳහන් කළයුතු අතර එම අංකය තක්සේරුකරු විසින් වාර්තාව එවන අවස්ථාවේ දී එම වාර්තාවේ ද සඳහන් කිරීමට ඉල්ලීමක් ද කර යැවිය යුතුය. එසේම ඔබ විසින් එසේ යවනු ලබන ලිපියේ පිටපතක් මා වෙත ද එවීමට කටයුතු කරන්න. ඉහත ඉල්ලීම අනුව සකස්කරනු ලබන තක්සේරු වාර්තාවල මුල් පිටපත කෙළින්ම මා වෙත එවීමටත්, දෙවන පිටපත ඔබ වෙත යැවීමටත් මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමටත් කටයුතු කරන ලෙසට ප්‍රධාන තක්සේරුකරු වෙත මවිසින් ඉල්ලීමක් කරනු ලබන බව ද කරුණාවෙන් දන්වමි.

එස්.ජේ.පතිරණ
ඉඩම් කොමසාරිස්.

පිටපත:- 1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය.
2.ප්‍රධාන තක්සේරුකරු.
3.පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.
4.නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්.